# කෘතවේදී : ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පියදාස රණසිංහ අභිනන්දන ග්‍රන්ථය

# Kritavedi : Festschrifṭ for Senior Professor Piyadasa Ranasinghe

### සංස්කරණ උපදේශනය

මහාචාර්ය එම්. පී. සතිජා

මහාචාර්ය ඒ. එච්. එම්. එච්. අබයරත්න

### Consultant Editors

Professor M.P. Satija

Professor A.H.M.H. Abayarathna

### සංස්කාරකවරු

ලෑගුම්දෙණියේ පියරතන හිමි

මහාචාර්ය ඩබ්ලිව්. ඒ. වීරසූරිය

ආර්.ඩී. ආනන්ද තිස්ස

### Editors

**Rev. Legumdeniye Piyarathana**

**Professor W.A. Weerasooriya**

**R.D. Ananda Tissa**

2014

# පොළොන්නරු යුගයේ පොත්ගුල් සංවර්ධනය සඳහා I විජයබාහු සහ I පරාක්‍රමබාහු රජවරුන්ගේ දායකත්වය පිළිබඳ විමසීමක්

ආචාර්ය ආර්.එච්.අයි.එස්. රණසිංහ


සාරාංශය

*I විජයබාහු සහ I පරාක්‍රමබාහු රජවරුන් රටේ සාමයික පරිසරය නගා සිටුවා ආගමික, අධ්‍යාපනික, හා ශාස්ත්‍රීය සංවර්ධනයට කරන ලද මෙහෙවර පොළොන්නරු යුගයේ පොත්ගුල් සංවර්ධනයට ඉවහල් වූ අන්දම විමසීම මෙම ලිපියේ අරමුණයි.*


ප්‍රමුඛපද : *ශ්‍රී ලංකාවේ පුස්තකාල, පොළොන්නරු යුගය, පොත්ගුල්, පුස්තකාල ඉතිහාසය*

මෙරට අවසියවසකටත් නොඅඩු කාලයක් පැවති චෝළ බලය බිඳ I විජයබාහු රජු පොළොන්නරුවේ රාජ්‍ය පිහිටුවා ගන්නාවිට, අනුරාධපුර රාජධානියේ පැවති ශ්‍රී විභූතිය බිඳවැටී රට සම්පූර්ණයෙන්ම පිරිහී තිබුණි.

පොත්ගුල් සම්ප්‍රදායේ වර්ධනය සඳහා රටක සාමයික පරිසරය, ආර්ථික සංවර්ධනය මෙන්ම, ආගමික හා අධ්‍යාපනික සංවර්ධනයක් ද තිබිය යුතුය. චෝළ ආක්‍රමණයේ දී සහ ඔවුන්ගේ පාලන සමයේ දී රටේ සාමයික පරිසරය මෙන්ම ආර්ථිකය ද මුළුමනින්ම පිරිහුණි. එමෙන් විහාරාරාම සහ සඟපරපුර විනාශවීමත් සමග බුදුසමය ද විනාශයට පත් වූ හෙයින් ඒ හා අනුබද්ධව පැවති අධ්‍යාපනය ද විනාශ විය. අධ්‍යාපනයේ භාරකරුවන් ලෙස ක්‍රියාකළ භික්ෂූන් වහන්සේලාට සිවුරු හැරීමට හෝ ජීවිතාරක්ෂාව සඳහා රටෙහි ආරක්ෂිත ස්ථානවලට හෝ විදේශයන් වෙත යාමට සිදුවිය.

මෙරට ක්‍රිස්තු පූර්ව තෙවන සියවසේ සිටම බුදුසසුන සමග අධ්‍යාපනය වර්ධනය වූ හෙයින් විජයබාහු රජුට රාජ්‍යාරම්භයේ සිටම පිරිහී තිබූ බුදුසසුන සහ අධ්‍යපනය නගාලීම සඳහා කටයුතු කිරීමට සිදුවිය. එතුමාගේ ඇවෑමෙන් පසුව නැවතත් රාජධානිය පිරිහී ගියෙන්, වසර හතලිස් හතරකට පසුව බලයට පත් වූ I පරාක්‍රමබාහු රජුට ද බුදුසසුන හා අධ්‍යාපනය නගාලීම සඳහා අපමණ මෙහෙයක් කිරීමට සිදුවිය.

පිරිහී තිබූ බුදුසසුන නංවාලීමට උත්සුක වූ විජයබාහු රජුට, ඒ සඳහා මූලිකත්වය ගෙන කටයුතු කළහැකි උපසම්පදාව ලත් භික්ෂූන් පස් නමක් හෝ මෙරටින් සොයා ගැනීමට නොහැකි විය. එබැවින්, අනුරුද්ධ රජුගේ සහයෝගය ඇතිව රාමඤ්ඤ දේශයෙන් භික්ෂූන් ගෙන්වා උපසම්පදා කර්මය සිදුකර ඇත.[1] මෙලෙස රාමඤ්ඤ දේශයෙන් පැමිණි භික්ෂූන් චෝළ අධිරාජ්‍ය පැවති සමයේ දී මෙරටින් ජීවිතාරක්ෂාව සඳහා එරටට පලාගිය භික්ෂූන් ලෙසටද සලකනු ලැබේ.[2] විජයබාහු රජුගේ අභාවයෙන් පසුව බුදුසසුන නැවත පිරිහී ගිය බැවින් පරාක්‍රමබාහු රජුද උපසම්පදා කර්මය සිදුකර ඇත.[3]

උපසම්පදා කර්මය ආරම්භයෙන් පසුව භික්ෂූන් සංඛ්‍යාවේ ප්‍රමාණාත්මක වර්ධනයක් සිදුවිය. කාලයාගේ ඇවෑමෙන් අනුරාධපුර යුගයේ මෙන්ම භික්ෂූන් මහාවිහාර, අභයගිරි හා ජේතවන නිකායයන් ලෙස බෙදුනි. එම බෙදීම ආගමික සංවර්ධනයට හිතකර නොවීය. එබැවින් විජයබාහු රජු තුන්නිකායවාසී භික්ෂූන්ට එකට වාසය කිරීමට කටයුතු සලසා ඇත.[4] නැවත වරක් ඒ ඒ නිකායන් අතර මතභේද ඇති වී තිබූ හෙයින් පරාක්‍රමබාහු රජු ද තුන් නිකාය සමගි කිරීමට කටයුතු කර ඇත.[5] නිකාය සමගිය බුදුසසුනෙහි සංවර්ධනයට හේතු වූ නිසා එමගින් අධ්‍යාපන සංවර්ධනය ද වූ බව නිසැකය.

පරාක්‍රමබාහු රාජත්වයට පත්වන අවස්ථාවේදී ද ශාසනය දුශ්ශීල භික්ෂූන්ගෙන් ගහණ වූ බැවින්, බුදු සසුන සංවර්ධනය සඳහා ශාසනය ශෝධනය කිරීමට සිදුවිය. එබැවින්, එතුමා දිඹුලාගල කාශ්‍යප හිමිගේ ප්‍රධානත්වයෙන් කළා වූ ශාසන ශෝධනයට දිවයිනේ සෑම පළාතකම සිටි ප්‍රධාන